# විමලරත්න කුමාරගම

## නැවත කියැවීම 4



රත්න ශ්‍රී විජේසිංහ



විමලරත්න කුමාරගම 1942 දී ලියූ ලිපියකින්

වන්නියේ ජීවිත පීඩනයට පත්වන්නේ සොබා දහමේ අකාරුණිකත්වය වැඩ වසම් අවි මුගුරු සහ දරිද්‍රතාව අතින් පමණක් නොවේ. ඔවුහු විටෙක ලිංගික සූරාකෑමටද ලක්වෙති. 'දීග හතළිහ' නමින් කුමාරගම කවියට නගන කළුවරගහ ගෙදර සුවඳීගේ අසාමාන්‍ය චර්යාව ඊට එක් නිදසුනකි. ඇය විසිපස් හැවිරිදි වන නමුත් ඒ වන



විට දීග හතළිහක ගොසිනි. පළමු දීගයෙන් ඈ හිරිහැර ලබා පැමිණි වග කියනු මිස ඇගේ චර්යාවට පදනම් වන සමාජ - ආර්ථික කරුණු ගැන කවියා නොකියයි. සුවඳීගේ අසාමාන්‍යතාවට හේතුව සහජ අත්‍යප්තිමත්භාවය හෝ අන් විකෘතියක් හෝ නොව, දරිද්‍රතාවම බව පැහැදිළිය. ගමට එන පාසල් ගුරුවරයාත්, දොස්තරත් විසින් ඇය සූරාකනු ලබන්නේ එහෙයිනි. ඔවුන්ට ඇය ගොදුරු කරගත හැකි වන්නේ ඇගේ පරායක්ථ භාවය නිසා නොවේද?

අලියා වැටුනු වැව, වෙල ළඟ ගෙදර, 'කලු' ගේ පුවත ද එබන්දක්ම වේ. එය 'සුවඳී' ගේ පුවතට වඩා ඛේදවාචකයකි.

අලියා වැටුනු වැව වෙල ළඟ ගෙදර කලු
හරි සම්තියකි පියුමට පන් පැදුරු මලු
ඇගෙ අඟ පසඟ පියකරු මඳහසද බැලූ
හැම දෙනකුට ම ඒ රුව සිහි තියෙන වලු
(වන්නියේ දොස්තර)

රුවැත්තියක වූ 'කලු' කවියාගේ පවා නොමඳ අවධානය දිනාගන්නීය. වැවට නාන්ට ගිය ඔහුට ඇය මුල්වරට හමුවේ. පැයක් නැවද ඔහුට ඊ වෙනු පවා නොදනේ. ඕ හදිසියේ මියයන්නීය. ඒ මැල වී ගිය පරිසරයේ ඇගේ පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වෙද්දී, 'ඌ පමණක්ය නොසිටියේ රට අවුල් කළ' යනුවෙන් කවියා කියයි. ඌ යනු, ඇගේ ජීවිතය අවුල් කළ ඇයට කඳුරු කා දිවි නසා ගන්නට සැලැස්සූ පස්සර උපන් වන්නියේ දොස්තරය.

ඉදිමී නිල්ව ගොස් තුන් ඉරි
වැටුන ගෙල
හැකිලී කළුව පුන් පියයුරු
තැඹිලි පල
පිපිරී ඇලී ඇත මඳහස රැඳුණ
තොල
පරවී නොවේ පණුවෙක් කා
කුණුව මල
(වන්නියේ දොස්තර)

ලිංගික සූරාකෑමට හසුවූ ඈ සතු සියලු සෞන්දර්යයට කුමක් වී තිබේද? අකල්හි පරවී වැටුනු මේ කුසුම පරවූවා නොවේ. එමල පණුවන් විසින් නොව, පණුවකු විසින් කා දමා පරවිණැයි කවියා නිශ්චිත පුද්ගලයකු නම් කරයි. වන්නියේ වැඩ වසම් සමාජ ස්ථානයෙහි ආධිපත්‍යය දරන්නේ ආරච්චි රාළය. ගැමියන් පිහිට ලැබ ඔහුගේ ලිපෙහි ගිනි ඇවිලුවාද හැම ගැමියෙක් ම ඔහුගේ පා මුල හැපෙයි. ඔහුට පවා ගමට සේන්දු වන ධනේශ්වර ක්‍රමයේ නියෝජිතයාට එය වන්නට සිදු වෙයි.

අලියා වැටුණු වැව
ආරච්චි රාළට
මුව මස් ඌරු මස් හිඟ
නොමැත කෑමට
මුළු ගං ගොඩම හිටියත්
ඔහුගෙ වාලට
ඔහු වැඩි පුරම බය ලොකු
සයිබු නානට
(ආරච්චි රාළ)

කුමාරගම කවියා ආරච්චි රාළ නිරූපනය කරන්නේ තියුණු විරෝධාකල්ප ස්වරයකින් හෝ ඔහුට පක්ෂග්‍රාහී ස්වරයකින් හෝ නොව, කවියකුට හිමි සංයමශීලී යථාර්ථවත් දැක්මකිනි.

කුරහන් වීයෙන් නිහිතුන ඉදිමුණ ද ඉබේ
යම්කිසි බියක් ඔහුගේ නෙත් අතර තිබේ

එනයිනි, ඔහුගේ බියපත් දෑස් කවියාට දකගත හැකිවන්නේ. වන්නි ගම්වල ප්‍රජා නායනකත්වයෙහි හා ප්‍රාථමික දේශපාලන අධිකාරියෙහි ප්‍රධානත්වය දරන සෝවිස් ගේ චරිතයද අපූරුය. අදින් අඩ සියවසකටත් එපිට වනගත ගමකට නායකත්වයදුන් සෝවිස්, වර්තමාන දේශපාලනයේද මුඛ්‍ය ගති ස්වභාව වන, වනචරත්වය, රැවටිලිකාරකම සහ නිස-සාරත්වය නොඅඩුවම පළකරයි. ශ්ලේෂාලංකාරය මඳ රචනා විධි ක්‍රමයක් භාවිත කරන, එහෙත් ශ්ලේෂයක් නොව මේ වැනුමෙහි සියලු න්‍යස්ථාස්ථ වලින් පළවන්නේ අස්ත්‍යර්ථ වීම නිසා උපදින්නේ අපූරු උත්ප්‍රාසයකි. උත්ප්‍රාසය මේ රචනයේ ප්‍රධාන රසෝද්පාදක විධියයි.

විමලරත්න කුමාරගම (1919 - 1962) සිය හතළිස් හතර හැවිරිදි ජීවිතයෙන් වසර විසි හතරක්ම කවිය සමඟ අවියෝජනීයව බැඳෙමින් දිවි ගෙවූවෙකි. 1935 වසරේදී සිය සොහොයුරියගේ වියෝව නිසා හටගත් සංවේදනා 'සංවේග වේදනා' නමින් කවි පොතකට ගොනු කරමින් තම මුල්ම කවි ලිවීම ඇරඹූ හෙතෙම, හතළිස් හතර වන විය සපුරන්ට දින දහ අටක් තිබියදී, 1962 දෙසැම්බර් 30 දා මහනුවර රෝහලේදී සමුගෙන යන්නට දින කීපයකට පෙරද කවි ලියුවේය. දිනපොතේ ලියූ කවි අතර ඔහුගේ අවසන් කවිය හමුවන්නේ දෙසැම්බර් 17 දා ය.

හොඳ වැඩවලට සහතිකපත් ලබා ඇතී
මොහු ගම්වඩන සමිතියෙ දැන් සබා පතී
කවදා නමුදු හොරහරකකු මරා නැතී
මොහු ගම් වඩන සමිතියෙ ගරු සබා පතී

බණ සාලාවටත් මුල්ගල තබා ඇතී
හාමුදුරුවොත් මොහුගේ ගුණ වදාරතී
සහවර පිරිස එකතුව හොර කඩේ යතී
මොහුගේ ගෙදර නම් හොරබඩු අනේ නැතී
(සෝවිස්)

අලියා වැටුනු වැව වෙල ළඟ ගෙදර කලුගේ මළගමට වැඩම නොකළද වන්නියේ ගම්වල භික්ෂූන් වහන්සේද වෙති. කුමාරගම කවියා කීප වරක් ම උන්වහන්සේ ගේ ක්‍රියාකාරකම් ගැන ලියා තිබේ. රෑ දානය, මෝලි පූජාව, තෙවළා බණ ආදී කවි ලියැවී ඇත්තේ ගම්මානවල පන්සල්හි වැඩ වසන එබඳු භික්ෂූන්ගේ සහ ඇසුරු කරන ඇතැම් 'උපාසක' ඇත්තන්ගේ තොරතුරු පුවත් පළ කරනු සඳහාය. සරළ හාස්‍යය සහ උපහාසය දනවන එකී රචනා කෙටි වෘත්තාන්ත කථනයක්ද ඉදිරිපත් කරතත් නොගැඹුර නිර්මාණයන්ද.... එහෙත් 'දේදුන්න' 1948 මාර්තු කලාපයේ පළවී ඇති 'වන්නිහේ හේරත්' නම් අපූරු කවි පෙළකි.

වයසට ගිය නමුදු ඇඟපත ඇතිය මිටී
වන්නියේ වීර ගස උපමාවකට වටී
නායක හිමිගෙ අවිහිංසක කමක හැටී
ඉනිකුණු පවුල් සිවුරේ රැළි අතර සිටී
(වන්නියේ සෝරත)

සිවු පසය හිඟ, දිළිඳු දායක දායිකාවන් වෙසෙන එගම්හි පන්සල්වල භික්ෂූන් වහන්සේ නිර්වාණ මාර්ගයට හා ලෝකෝත්තර සුබ සාධනයට වඩා ලෞකිකත්වය නැඹුරු වීමත් හරිපමණකින් හැඩි දැඩි වීමත් ව්‍යවහාරික බුදු සමයේ ස්වභාවයයි. එහෙත් උන්වහන්සේ අහිංසකයහ. ජෛනයෝ තරම්ම උග්‍ර අවිහිංසාවාදීයහ.
කවියා මෙහිදී ද හිමි ගුණ වනන ස්වරූපයෙන් කියා සිටින්නේ කැළම එහි විලෝපයයි. උත්ප්‍රාසය මෙහිද මුඛය ලක්ෂණයයි.

'මගෙ ඇස මෙන්ම සිගිරිගෙ ඇසද දුරදකී
නාහිමි දොස් කීව එහෙයින් එරදකී'

ඔහු කියයි. රජමහා විහාරයේ ගල්කණු බිම ඇද වැටී ඇත. නාහිමියෝ ඇඟ දූලි ගා ගෙන, දහඩිය දමාගෙන වැඩෙහි යෙදෙති. එහෙත් වෙහෙරේ පුදසුන අසලම හතු පිපී තිබේ. උන්වහන්සේ ඩහදිය වගුරමින් කරන්නේ ආමිස හෝ ප්‍රතිපත්ති හෝ පූජා නොව වෙනත් දේය. එහෙත් ඒ කටයුතුද නිර්වාණගාමී වෙතැයි කවියා කියයි.

සෝරත සමිඳු වැනි හත්පත්තු දෙකකට
වඩුවෙක් නොවී මා වන්නියෙහි සිටිවිට
හත් අට දෙනකු හුැර හේනටද කුඹුරට
බිහි කළ නිසා ඉඩ ඇත හිමිට නිවනට

ඇඳ පුටු මේස වංගෙඩි හදති හදවතී
පොල් මල්වලින් මව් කිරි රසය මුදවතී
සමිඳුගෙ පිහිට මුළු වන්නියට වැදගතී
කොල්ලෝ සීතලට කහ සිවුරු පොරවතී

මේ හිමි නගන බණපොත් ඇති රාක්කිය
ගම්නඩුවලට ගොස් දෙති බොරු සාක්කිය
පන්සල අසල ඇති වැන්දඹු රාක්කිය
උම්මගෙ දුවගෙ නම 'පන්සල් කාක්කිය'
(වන්නියේ සෝරත)

කුමාරගම කවියා වන්නියේ ජන ජීවිතය දැක, විඳ හදාරා ලබා ගත් අතිමහත් අත්දැකීම් සම්භාරයත් ශික්ෂණයත්, පසු කලෙක විවිධ සමාජ තල වෙත පිවිස සියුම්ව නිරීක්ෂණය කරන්නට මෙන් ම, යථාර්ථවාදීව ඒ අත්දැකීම් විවරණය කරන්නටත් ඔහුට මඟ පෙන්වා තිබේ. වන්නියේ නියඟ මෙන් නොව, රත්නපුරේ කුකුළු කෝරළයේ ජනතාව පෙළන්නේ වැස්සයි. සොබා දහම.... දරිද්‍රතාවයේ එකම විත්තිකරුවා නොවන වග කවිය ඉතා පහසුවෙන් ම වටහා ගනී. 'රතුකැට' ඊට නිදසුනකි. 'මට බෑ කන්ට රතුකැට වෙන අය වාගේ' යි ඔහු කියයි.
'මම මිණි බිමට ආවෙමි තණ පඳුරු සිඟා' යනුවෙන්ද කියයි. මෙහිදී දරිද්‍රතාව කවියා අවට වෙනත් වේශයකින් පෙනී සිටී.
වහලට සෙවන මානා බේරු බටකොළ

වැරණිය කෝටු නිරුවත් මිතුය වටකළ
ගෙබිමයි ඇඳයි මහ වැහි පොකුරු වටවළ
නුදුටිමි මෙවැනි තතු මා හිටිය රටවල
(රතුකැට)

මතු සම්බන්ධයි